


විදේශ ගත ශ්‍රමිකයින් නීත්‍යානුකූලව බැංකු ක්‍රමය හරහා මෙරටට මුදල් එවීමේදී ඉලෙක්ට්‍රික් වාහනයක් ආනයනයනය කිරීමට ආනයනය බලපත්‍රය ලබාගැනීම සඳහා වන අයදුම්පත්‍රය ප්‍රසිද්ධියට පත් කර තිබෙනවා.

කම්කරු සහ විදේශ රැකියා අමාත්‍යාංශයේ වෙබ් අඩවියට පිවිසීමෙන් හෝ https://si.labourmin.gov.lk යන වෙබ් ලිපියන ඔස්සේ අදාල අයදුම්පත්‍රය භාගත කිරීමට හැකියාව පවතිනවා.

නීත්‍යානුකූලව බැංකු ක්‍රමය හරහා මුදල් එවන විදේශ ගත ශ්‍රමිකයින් සඳහා සහන රැසක් ලබාදීමට කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනූෂ නානායක්කාර කටයුතු කර ඇති අතර, විදේශ ගත ශ්‍රමිකයින්ට ඉලෙක්ට්‍රික් වාහනයක් ආනයනය කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගෙන තිබුණා.

ඒ අනුව ඉලෙක්ට්‍රික් වාහන ආනයනය සඳහා අවසර ලබාදෙන ගැසට් නිවේදනය සහ අයදුම්පත්‍රය නිකුත් කර තිබෙනවා.

ඒ අනුව මේ වසරේ මැයි පළමුවැනිදා සිට ලබන වසරේ අප්‍රේල් 30 වැනිදා දක්වා කාලය තුළදී ඇමරිකානු ඩොලර් තුන්දහකට වඩා වැඩි මුදලක් බැංකු ක්‍රමය හරහා මෙරටට එවා ඇති ශ්‍රමිකයින් සඳහා තමන් එවා ඇති මුදල් ප්‍රමාණයෙන් සියයට පනහක වටිනාකමකින් යුත් ඉලෙක්ට්‍රික් යතුරුපැදියක් ආනයනය කිරීම සඳහා අවසර ලබා දෙනවා.

මේ වසරේ මැයි පළමුවැනිදා සිට දෙසැම්බර් 31 වැනිදා දක්වා වන කාලයක තුළදී ඇමරිකානු ඩොලර් විසිදහක මුදලක් එවා ඇති ශ්‍රමිකයින් සඳහා ඉලෙක්ට්‍රික් වාහනයක් ආනයනය කිරීම සඳහා අවසර ලබාදෙන බව චක්‍රලේඛයේ වැඩිදුරටත් සඳහන් වනවා.

නීත්‍යානුකූලව බැංකු ක්‍රමය හරහා මුදල් එවන ශ්‍රමිකයින් සඳහා ගුවන්තොටුපොලේදී ලබාගත හැකි තීරුබදු සහනය ඇමරිකානු ඩොලර් 6550 දක්වා ඉහළ නැංවීමටත් මනූෂ නානායක්කාර අමාත්‍යවරයා ඉදිරිපත් කර ඇති කැබිනට් පත්‍රිකාවටද කැබිනට් අනුමැතිය හිමිවී තිබෙනවා.